# ආධ්‍යාත්මිකත්වය පෝෂණයෙහිලා නාගාර්ජුන පාදයන්ගේ බෞද්ධ දාර්ශනික ස්ථාවරයේ බලපෑම; මූලමධ්‍යමකකාරිකාව ඇසුරින්

**ඒ.කේ.සී. අයේෂානි අබේසිංහ**[1]

## හැඳින්වීම

මහායානයේ බිහිවීම එක්වර ම සිදුවූවක් නොවන අතර එය සම්ප්‍රදායන් කිහිපයක් බිහිවෙමින් පැමිණි ගමනක ප්‍රතිඵලකි. මහායානය තුළ වූ වැදගත් සම්ප්‍රදායක් ලෙස මධ්‍යමක දර්ශන සම්ප්‍රදාය හඳුනාගත හැකි ය. මධ්‍යමක දර්ශනයේ ආරම්භකයා නාගාර්ජුන පාදයෝ ය. මධ්‍යමක දර්ශනය ඉදිරිපත් කරමින් නාගාර්ජුන පාදයන් විසින් රචනා කරන ලද සුවිශේෂී ග්‍රන්ථය මූලමධ්‍යමකකාරිකාව වේ. මෙකී ග්‍රන්ථය මධ්‍යමක දර්ශනයේ ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සැලකේ.

එහි දී ශූනතාවාදී දර්ශනය හෙවත් සියලු ධර්මයන් ශූන්‍ය බව විද්‍යාමාන කරන අතර ධර්ම මාර්ගය පවා ශූන්‍ය ලෙස දක්වා ඇත. ශූන්‍යතාවය යන ස්වයං නිෂ්ප්‍රභවීමක් නොවන අතර ඒ සියලු ධර්මයන්, ප්‍රත්‍යයන් ආශ්‍රයකොට ගෙන ඇතිවන්නා සේම, ප්‍රත්‍යයන් ආශ්‍රකොට ගෙනම පවතින නිසාම, ධර්මයන්ට අනන්‍ය වූ ස්වභාව පැවතිය නොහැකි බව පෙන්වා දෙන්නකි. මේ අනුව ශූන්‍යතාවය යනු තවත් එක් දෘෂ්ටියක් නොවන බවත් එය පටිච්ච සමුප්පාදය ම බවත් නාගාර්ජුන පාදයන් තම මූලමධ්‍යමකකාරිකාව තුළන් විද්‍යාමාන කරනු ලැබේ.

ශූන්‍යතාවය වූ කලී සියලු දෘෂ්ටින් දුරු කිරීම සඳහා භාවිත කරනු ලබන උපාය මාර්ගයකි. මෙහි දී අදාළ කාර්ය ඉටු කිරීමෙන් පසු එහි උපයෝගීතාවය අවසන් වෙයි. ඒ අනුව ආධ්‍යාත්මිකත්වය උදෙසා ගුණ පුරන්නෙකුට ශූන්‍යතාවය හෙවත් පටිච්චසමුප්පාදය අවබෝධ කරලීම වනාහි නිර්වාණාවබෝධය ලැබීම ම වේ. මෙලෙස ආධ්‍යාත්මික ජීවිතයේ එක් එක් තලයන් වෙත ප්‍රවිශ්ට වීමට මං පෙත් විවර කිරීම නාගාර්ජුන පාදයන්ගේ ශූන්‍යතා දර්ශනයෙන් ප්‍රකට වේ.

ආධ්‍යාත්මික සංවර්ධනයට නාගාර්ජුන තෙරුන්ගේ බෞද්ධ දාර්ශනික ස්ථාවරය යොදාගත හැකි ද? යන්න මෙම පර්යේෂණයෙහි ගැටලුව වේ. ඒ අනුව මෙම පර්යේෂණයේ අරමුණ නාගාර්ජුන පාදයන් විසින් මධ්‍යමක දර්ශනයේ අත්පොත ලෙස රචිත මූලමධ්‍යමකකාරිකාව තුළින් ආධ්‍යාත්මිකත්වය පෝෂණයෙහිලා නාගාර්ජුන පාදයන්ගේ බෞද්ධ දාර්ශනික ස්ථාවරය විමසීමට ලක් කිරීම යි.

බුදු දහමේ මූලික හා සුවිශේෂී ඉගැන්වීම් පිළිබඳ ගැඹුරු විවරණ මූලමධ්‍යමකකාරිකාවේ පරිච්ඡේද 27ක් තුළ දී පද්‍ය 448කින් ඉදිරිපත් කරන අතර ආධ්‍යාත්මිකත්වය පෝෂණයෙහිලා මෙකී කාරිකාවේ අන්තර්ගතය විමසීම පර්යේෂණයේ සීමාව වේ.

1. සිව්වන වසර, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැලණිය, ශ්‍රී ලංකාව. chamoayesha9653@gmail.com

1963 වර්ෂයේ දී මොරටුවේ සාසනරතන හිමියන් මූලමධ්‍යමක කාරිකාවේ පෙළ ද එහි සිංහල පරිවර්තනය ද පිටු සියයක පමණ දීර්ඝ හැඳින්වීමක් සහිතව අංග සම්පූර්ණ අධ්‍යයනයක් අනුලා මුද්‍රණයක් ලෙස ඉදිරිපත් කෙරිණි. ඉන් අනතුරුව උන්වහන්සේ ම 1970 දී පළකළ 'මධ්‍යමක දර්ශනය' කෘතියේ මුල් කොටස තුළ ද මධ්‍යමක දර්ශනය පිළිබඳ අධ්‍යයනයක් පවතී. මහාචාර්ය අසංග තිලකරත්නයන් 2001 වර්ෂයේ පළමු මුද්‍රණය ලෙස ඉදිරිපත් කළ 'ශූන්‍යතාවාදයෙහි දර්ශනය හා චරණය' නම් කෘතිය තුළ ද ඩේවිඩ් ජේ. කලුපහන ශූරීන්ගේ විශිෂ්ට පෙරවදනක්, මධ්‍යමක දර්ශනයේ ආරම්භය හා විකාශය පිළිබඳ දීර්ඝ හැඳින්වීමක් සහිත ව මූලමධ්‍යමකකාරිකාවේ පද්‍ය හා සිංහල අනුවාදය මෙන් ම විවරණ සහිත විශිෂ්ට රචනයක් ඇතුළත් වේ. මෙම සිංහල කෘති සමස්තය මෙන් ම 1986 දී කලුපහන ආචාර්යතුමන් විසින් රචිත 'Nāgārjuna: The Philosophy of the Middle Way' යන ඉංග්‍රීසි කෘතිය ද මධ්‍යමක දර්ශන සම්ප්‍රදාය ඉගෙනීමේ මූලික මූලාශ්‍රයක්ව පවතී. මෙම කෘති අනුසාරයෙන් සිදු කරන ලද අධ්‍යයනයේ ප්‍රතිඵලයක් ලෙස මූලමධ්‍යමකකාරිකාව ඇසුරෙන් ආධ්‍යාත්මිකත්වය පෝෂණයෙහිලා නාගාර්ජුන පාදයන්ගේ බෞද්ධ දාර්ශනික ස්ථාවරය විමසීමට ලක් කිරීම මෙහි දී සිදුවේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙහි දී මූලමධ්‍යමකකාරිකාව ඇතුළත්ව සවිද්වත් කෘති හා ලිපි ලේඛන පරිශීලනය කෙරේ. ඒ අනුව මූලාශ්‍රය අධ්‍යයනය මත පදනම්වන මෙම පර්යේෂණය සාහිත්‍ය විමර්ශනයෙන් ලබාගන්නා දත්ත සංධාර විශ්ලේෂණය යටතේ හැදෑරීමකට ලක් කොට ඉදිරිපත් කරන බැවින් ගුණාත්මක පාර්ශවයට අයත් පර්යේෂණයක් ලෙස සැලකේ.

**ප්‍රතිඵල**

මූලමධ්‍යමකකාරිකාව යනු ශූන්‍යතා දර්ශනය පැහැදිලි කිරීම සඳහා නාගාර්ජුන පාදයන් විසින් රචිත මාධ්‍යමකයන්ගේ අත්පොත ලෙස සලකන කෘතියයි. එකී කෘතිය තුළ නාගාර්ජුන පාදයන්ගේ බෞද්ධ දාර්ශනික ස්ථාවරත්වය පැහැදිලි කරයි. එනම් ශූන්‍යතාවය පැහැදිලි කරයි.

මුල් බුදු සමයාගත පටිච්චසමුප්පාදය ම ශූන්‍යතාවය වශයෙන් හඳුනාගත හැකි ය. මෙම ශූන්‍යතාවය අවබෝධය ආධ්‍යාත්මිකත්වය සඳහා පුද්ගලයා මෙහෙයවනු ලබයි. ඒ අනුව පුද්ගලයාගේ ඉහළම අරමුණ සෙවීමේ මාර්ගය වන නිර්වාණගාමී මාර්ගය වෙත පුද්ගලයා මෙහෙයවන ප්‍රබල මෙවලමක් ලෙස ශූන්‍යතාවය හඳුනාගත හැකි යි. සත්කර්මයන්ගෙන් පිරුණු ජීවිතයක් ගත කෙරෙමින් මනස හා බුද්ධිය පිරිසිදු කිරීමේ, ආධ්‍යාත්මිකත්වය පෝෂණයට නාගාර්ජුන පාදයන්ගේ බෞද්ධ දර්ශනික ස්ථාවරත්වය හෙවත් ශූන්‍යතාවය ප්‍රබල බලපෑමක් සිදු කරන බව මූලමධ්‍යමකකාරිකාව ඇසුරින් හඳුනාගත හැකි ය.

**සාකච්ඡාව**

ආධ්‍යාත්මිකත්වය යනු පුද්ගලයකුගේ අභ්‍යන්තර අත්දැකීම්, මනෝභාවයන් හා යථාර්ථයේ ගැඹුරු අවබෝධය හඳුනාගැනීම හා වර්ධනය කිරීමේ ක්‍රියාවලියයි.

ආධ්‍යාත්මිකත්වය ජීවිතයේ යථාර්ථය සෙවීම, මනසේ සාමය ඇති කිරීම හා ස්වයං මනෝභාවය වර්ධනය කිරීමේ උත්සාහයන්හි මූලික මට්ටමක් ලෙස සැලකේ. ආධ්‍යාත්මකත්වය අතථ්‍ය හා ගැඹුරු අවබෝධයක් ලෙසත් පුද්ගල ජීවිතයේ ඉහළම අරමුණ සෙවීමේ මාර්ගය ලෙසත් විස්තර වෙයි. (Koenig, H. G. (2012). Religion, Spirituality, and Health: The Research and Clinical Implications. ISRN Psychiatry)

බුදු දහමට අනුව ආධ්‍යාත්මිකත්වය යනු නිවන් මග ගමන් කිරීම සඳහා මනස හා බුද්ධිය මෙහෙයවීමේ ක්‍රියාවලිය යි. ධම්මපදයට අනුව සියලු බුදුවරුන්ගේ උදානය ලෙස ගැනෙන, 'සබ්බ පාපස්ස අකරණං...' යන ගාථාව තුළින් ආධ්‍යාත්මිකත්වයේ ගමන් මග විස්තර කරයි. ඒ අනුව සියලු අධර්මිෂ්ට ක්‍රියාවන්ගෙන් වැළකී, සත්කර්මයන්ගෙන් පිරුණු ජීවිතයක් ගත කරමින් මනස හා බුද්ධිය පිරිසිදු කිරීම ආධ්‍යාත්මිකත්වයේ මූලික අංගයන් වෙයි. එනයින් මනස පිරිසිදු කිරීමේ හා සත්‍ය සෙවීමේ මාර්ගය ආධ්‍යාත්මිකත්වයේ මාර්ගය වේ. (ධම්ම පදය, (2004). බුද්ධ වග්ගය, 183 ගාථාව.)

ආධ්‍යාත්මිකත්වයට මඟ කියන නාගාර්ජුන පාදයන්ගේ දාර්ශනික ස්ථාවරය විමසීමේ දී මූලමධ්‍යමකකාරිකාව තුළ විවරණය වන ශූන්‍යතාවාදී දර්ශනය වැදගත් වේ. ඒ අනුව මෙම ශූන්‍යතාවය නැමැති සංකල්පය තුළ විග්‍රහ කරනුයේ ලෝකයේ විද්‍යාමාන වන සියලු ම සංකත ධර්මයන්ගේ අනිත්‍ය ස්වභාවය යි. ලෝකයේ පවතින්නා වූ සත්‍ය සුපිරිසිදු කැඩපතක් මෙන් සියලු ම දේහි ප්‍රතිබිම්භයන් මවයි. නමුත් කැඩපත එම ප්‍රතිබිම්භයන් සමඟ කිසිදු ඇලීමක් ගැටීමක් උපාදානයක් ඇති කර නොගනියි. අනෙක් අතට ක්ලේෂයන් රහිත සියල්ලෙහි යථා ස්වභාවය දන්නේ වුවද ඒ කිසිවක් සමඟ ඇලීමක් ඇති කර නොගනියි. මධ්‍යමක දර්ශනය තුළ ප්‍රකට කරන ප්‍රතීත්‍ය සමුප්පාදයේ දී නැතිනම් සංස්කාර ධර්මයන්ගේ ශූන්‍යතාවය තුළ දී පුද්ගලයෙක් ඇත නැත යන දෙකම ප්‍රතික්ෂේප කරයි. මෙම මධ්‍යමක දර්ශනයෙන් පැහැදිලි කරනු ලබන්නේ හේතු ප්‍රත්‍යයන් රහිතව ජනිත වු කිසිවක් නොමැති බව යි. එසේ හේතු ප්‍රත්‍යයන් සහිත ව ඇති වන්නා වු දේවල් නිරන්තරයෙන් වෙනස් වීමකට හෙවත් විපරිනාමයකට පත් වෙයි. මොවුන් පැහැදිලි කරන ආකාරයට පුද්ගලයා ආදිය ප්‍රඥප්ති මාත්‍රයක් පමණි. මධ්‍යමක දාර්ශනිකයන් පෙන්වා දෙන්නේ යම් ධර්මයක් පරිනාමයට පත් නොවන යමක් වෙත් නම් එය හේතු ප්‍රත්‍යයන්ගෙන් ජනිත වුවක් නොවිය යුතු බව යි. එය වෙනත් කෙනෙකු විසින් උපද්දවන්නට හෝ විනාශ කිරීමට නොහැකි වන්නේය. මේ තුළ සියුම්ව මධ්‍යමක දාර්ශනිකයින් විසින් පැහැදිලි කරන්නේ වෙනස් නොවන ස්ථිරසාර සංස්කාර ධර්මයක් ලෝකයේ නොමැති බවත් මේ නිත්‍ය ස්වභාවයාගේ අභාවය ශූන්‍යතාවය නමින් හඳුන්වන බවත් ය. (තිලකරත්න, අසංග. (2011) 'මාධ්‍යමික ශූන්‍යතාවාදයෙහි දාර්ශනික සහ ආගමික අර්ථය')

නාගර්ජුන පාදයන් සිය මධ්‍යමක අදහස් ඉදිරිපත් කරමින් පෙන්වා දෙන්නේ ප්‍රතිත්‍ය සමුප්පාදය, ශූන්‍යතාව සහ මධ්‍යම ප්‍රතිපදාව යන සංකල්ප ත්‍රිත්වය ම සමානාර්ථවාචී වන බව යි. එනම් ඒ තුනෙන් ම අදහස් වන්නේ එකම අර්ථයක් වන බව යි. ඒ අනුව නිවන සාක්ෂාත් කිරීම සඳහා පටිච්ච සමුප්පාදය නම් වූ යථාර්ථය අවබෝධය, ආර්ය සත්‍යයන්ගේ යථා ස්වභාවය අවබෝධය ආධ්‍යාත්මිකත්වයෙහි පරිපූරණත්වයේ මාර්ගය වේ.

**නිගමනය**

මහායාන බුදුදහම තුළ වූ ප්‍රබල ම දාර්ශනික සම්ප්‍රදායක් වශයෙන් මධ්‍යමක දර්ශන සම්ප්‍රදාය හඳුනාගත හැකි ය. එහි ආරම්භකයා නාගාර්ජුන පාදයන් වේ. උන්වහන්සේ විසින් ගොඩනගන ලද දර්ශනය මූලික වශයෙන් මූලමධ්‍යමකකාරිකාව තුළ දැකගත හැකි ය. ශූන්‍යතාවය නම් පටිච්චසමුප්පාදයමයි. එමෙන් ම මධ්‍යම ප්‍රතිපදාව යනු ද එයම වේ. ඒ අනුව හේතු ඵල වාදයට යටත් නොවන කිසිම අයෙකු හෝ දෙයක් (ධර්මතාවක්) නොවන බවත් එහෙයින් සියල්ල හර හෙවත් ආත්ම වශයෙන් ගත නොහැකි ශූන්‍ය බවම ප්‍රකාශ කරයි.

නාගාර්ජුන පාදයන්ගේ ශූන්‍යතාවාදය බෞද්ධ දාර්ශනික සංකල්පයන්හි අති ප්‍රබල සන්ධිස්ථානයක් වේ. ඒ අනුව මූලමධ්‍යමකකාරිකාව ඇසුරින් නාගාර්ජුන පාදයන්ගේ බෞද්ධ දාර්ශනික ස්ථාවරත්වය හෙවත් ශූන්‍යතාවය හඳුනාගත හැකි අතර ශූන්‍යතාවය ආධ්‍යාත්මිකත්වය පෝෂණයෙහිලා ප්‍රබල බලපෑමක් සිදු කරන බව හඳුනාගත හැකි ය.

**මුඛ්‍ය පදඃ** ආධ්‍යාත්මිකත්වය, දාර්ශනික ස්ථාවරය, නාගාර්ජුන පාදයෝ, මූලමධ්‍යමකකාරිකාව, ශූන්‍යතාවය

**ආශ්‍රිත ග්‍රන්ථ**

ඥාණසීහ හිමි, හේන්පිටගෙදර. (1969). *ශූන්‍යතා දර්ශනය*. කොළඹඃ රත්න පොත් ප්‍රකාශකයෝ.

ඥාණිස්සර හිමි, අල්පිටියේ. (1988). *භාරත දර්ශන*. කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

තිලකරත්න, අසංග. (2020). ශූන්‍යතාවාදයෙහි දර්ශනය හා චරණය. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

තිලකරත්න, අසංග. (2011). 'මාධ්‍යමික ශූන්‍යතාවාදයෙහි දාර්ශනික සහ ආගමික අර්ථය'. විජිතධම්ම හිමි, මැදගම්පිටියේ සහ විමලඥාණ හිමි, මිරිස්වත්තේ. (සංස්.) *දාර්ශනික අධ්‍යයනඃ දර්ශනපති හෝමාගම ධම්මානන්ද නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය කලාපය*. වාද්දුවඃ ප්‍රවචනෝදය පිරිවෙන.

ශාසනරතන හිමි, මොරටුවේ. (1963). *ආචාර්ය නාගර්ජුන පාදයන්ගේ මූලමාධ්‍යමිකකාරිකාව*. පානදුරඃ පී. ජේ. රොද්‍රිගු.

Kalupahana, D.J. (1986) *Nāgārjuna: The Philosophy of the Middle Way*. Albany: SUNY Press.